**සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව - 2019**

**........................................................................**

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය වියාචනය

සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ("සමාගමේ") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

මෙම කරුණු හේතුවෙන්, වාර්තා කළ හෝ වාර්තා නොකළ මුදල් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් කිසියම් ගැළපීමක් අවශ්‍ය වී ඇත්දැයි මට තීරණය කිරීමට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක්වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ආරම්භක ශේෂ ගිණුම්කරණ පද්ධතිය වෙත ඇතුළත් කිරීමට යොදාගත් "ආරම්භක ශේෂ හිමිකම් ගිණුමේ" (Opening balance equity) රු.මිලියන 3.02 ක වෙනසක් පැවති බැවින් එම වෙනස හෙළිදරව් කර ගැනීමකින් තොරව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ රඳවාගත් ලාභයට ගැලපුම් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ගත් 2018 වර්ෂයේ ශේෂ පිරික්සුමෙහි opening balance equity ගිණුම ශුන්‍ය විය යුතු වුවත් එහි රු.මිලියන 6.70 ක ශේෂයක් පැවති අතරම එම ශේෂය කිසිදු ගිණුමක් වෙත ගලපා නොතිබුණි. මේ අතරින් හඳුනා ගත හැකි වූ ශේෂ ගැලපීමකින් පසුව ඉතිරි වූ මෙම රු.මිලියන 3.02 ක ප්‍රමාණය රඳවා ගත් ලාභය වෙත ගැලපීම් කිරීමට සිදු විය. | හිමිකම් ගිණුමෙහි ආරම්භක ශේෂ වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන ගැලපිය යුතුය. |

### 1.5.2 කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 18.91 ක පෙර වර්ෂ ගැලපීම් සිදු කර තිබුණු නමුත් කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ 10.23 ඡේදයට අනුකූලව වරදේ ස්වභාවය, මූල්‍ය ප්‍රකාශනය තුළ සිදුවන බලපෑම සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සටහන් දීර්ඝ වීමක් සිදුවන බැවින් ගිණුම්කරන පද්ධතිය වෙත ගැලපීම්කිරීම පමණක් සිදු කරන ලදී. නමුත් ඉදිරි ගිණුම් සකස් කිරීමේදී සෑම මූල්‍ය ප්‍රකාශනවල පේළි අයිතමයක් සඳහාම නිවැරදි කිරීමේ වටිනාකම, ආරම්භක ශේෂ වෙනස් කිරීම් ආදී වශයෙන් හෙළිදරවු කිරීම් සිදු කරනු ඇත. | ඉදිරියේදී කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව අවශ්‍ය හෙළිදරව් කිරීම සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන රු.මිලියන 1.02 ක පරිගණක මෘදුකාංග පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කර අවසන් වුවද කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ ඡේද අංක 18.24 ප්‍රකාරව ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සහ ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කර ඡේද අංක 10.15 සිට 10.18 ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පරිගණක මෘදුකාංග පද්ධතියෙහි පිරිවැය සම්පූර්ණයෙන් ක්‍රමක්ෂයකර ඇති අතර ධාරණ අගයක් නොපවතී. එබැවින් ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කිරීම ගැටළුසහගත වේ. | ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ප්‍රමිති ප්‍රකාරව වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සම්පූර්ණයෙන් ක්ෂය කළද සමාගම විසින් තව දුරටත් භාවිතා කරන රු.මිලියන 42.72 ක පිරිවැය වූ මෝටර් වාහන සහ ලී බඩුවල ඵලදායි ජීව කාලය කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහාවන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ ඡේද අංක 17.19 ප්‍රකාරව සංශෝධනය කර ගිණුම්ගත කර නොතිබුණි. | දැනට පූර්ණ ක්ෂය නොවී පවතින වත්කම්වල ඵලදායි ජීවිත කාලය ඇස්තමේන්තු කළ යුතු වුවද විස්තරාත්මක ස්ථාවර වත්කම් ලේඛනයක් නොමැති බැවින් ඒ සම්බන්ධව කටයුතු කිරීමට හැකි වී නොමැත. | ප්‍රමිති ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කර ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තොරතුරු තාක්ෂණ කළමනාකරුගේ 2019 සැප්තැම්බර් 04 දිනැති ලිපිය අනුව පරිගණක මෘදුකාංග පද්ධතියේ දත්ත විනාශවීමක් සිදුවී ඇති බැවින් සමාලෝචිත වර්ෂයේ මුදල් පොතේ ආරම්භක සහ අවසාන ශේෂවල නිවැරදිභාවය විගණනයේදී තහවුරු කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් නොවීය. එසේම සමාගම විසින් පවත්වාගෙන ගොස් තිබුණු බැංකු ගිණුම් 11 ට අදාළව මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 ට පැවති ශේෂය 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ආරම්භක ශේෂය ලෙස ගෙන ආ අතර එම ශේෂය භාවිතා කරමින් බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීම ගැටළුකාරී වූ බැවින් බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීමේදී පමණක් 2019 ජනවාරි 01 දිනට පැවති බැංකු ශේෂය භාවිතා කරමින්, ගනුදෙනු සිදු වූ බැංකු ගිණුම් 07 ක් සඳහා ගිණුම්කරන පද්ධතිය තුළින් මාසිකව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කරන ලද අතර එම සියලු ලේඛන 2025 සැප්තැම්බර් 15 දින විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | මුදල් පොත් සහ බැංකු සැසඳුම් නිවැරදිව සහ කාලීනව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම වූ රු.මිලියන 8.25 ක් වියදම් ලෙස ගිණුම් ගත නොකර මුළු විකුණුම් ආදායමෙන් අඩු කොට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබීම හේතුවෙන් විකුණුම් ආදායම් සහ වියදම් එම වටිනාකමින් ඌනගණනය වී තිබුණි. | මෙම ජාතිය ගොඩනැගීමේ බද්ද සෘජුවම විකුණුම් වටිනාකම මත බලපාන බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ විකුණුම් ආදායම් තුළ ගැලපුම් කරන ලදී. | ඉදිරියේදී ආදායම් හා වියදම් වෙන් වෙන්ව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පාරිතෝෂික අධි හෝ ඌන වෙන්කිරීම් ගැලපීමේදී, පසුගිය වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් රු.මිලියන 2.24 ක් වෙනුවට රු.මිලියන 0.46 ක් ගලපා තිබීම හේතුවෙන් රු.මිලියන 1.78 ක ඌන වෙන් කිරීමක් සිදුව තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම රු.මිලියන 4.87 ක් වෙනුවට සේවයෙන් ඉවත්ව ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකු සඳහා රු.මිලියන 0.95 ක් ඇතුළුව රු.මිලියන 3.09 ක් පමණක් වෙන්කිරීම් සිදුකර තිබුණු බැවින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ රු.මිලියන 1.78 ක ඌන වෙන්කිරීමක් සිදු වී තිබුණි. | 2018 වර්ෂයේ දී මුදලින් ගෙවූ රු.මිලියන 1.79 ක මුදල වර්ෂ අවසානයේ දී පාරිතෝෂික ඌන වෙන් කිරීම් ගැලපීමේ දී මඟ හැරී තිබුණු අතර ඒ සම්බන්ධව 2020 වර්ෂය සඳහාවන ගිණුම් සකස් කිරීමේදී ගිණුම් තුළට ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත.<br><br>2019 වර්ෂයේ දී මුදලින් ගෙවූ රු.මිලියන 2.73 ක මුදල වර්ෂ අවසානයේ දී පාරිතෝෂික ඌන වෙන් කිරීම් ගැලපීමේ දී මඟ හැරී තිබුණු අතර ඒ සම්බන්ධව 2020 වර්ෂය සඳහාවන ගිණුම් සකස් කිරීමේදී ගිණුම් තුළට ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත. | පාරිතෝෂිත වෙන්කිරීම් නිවැරදිව සටහන් කිරීමට සහ අදාළ ගැලපීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාගම විසින් ලංකා බැංකුවෙන් ලබාගත් ණය මුදලේ රු.මිලියන 16.17 ක පොලිය, මූල්‍ය වියදම් යටතේ හඳුනා නොගෙන පරිපාලන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2020 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය වියදම් යටතේ හඳුනා ගැනීමට කටයුතු කරනු ඇත. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ඒ ඒ වියදම් අදාළ වියදම් කාණ්ඩයන් යටතේ වර්ගකර දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාගම විසින් මහවැලි අධිකාරියෙන් පනස් අවුරුදු බද්දකට ලබා ගෙන තිබුණු ඇඹිලිපිටිය රූඩ් 01ක ඉඩම වෙනුවෙන් 1997 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගෙවීමට තිබුණු රු.මිලියන 1.27 ක හිඟබදු හා දඩය මේ දක්වා ගෙවා නොතිබුණු නමුත් මෙම මුදල් ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කිරීමට හෝ සටහන් මඟින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | බදු ගිවිසුම ප්‍රකාරව හිඟ බදු ගෙවීම් කිරීමටත් ගෙවිය යුතු බදු සම්බන්ධයෙන් නිසි පරිදි මූල්‍ය ප්‍රකාශනවල සටහන් තැබීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළදී සමාගමේ බැංකු ගිණුම්වලට සෘජුවම බැරකර තිබුණු එකතුව රු.මිලියන 102.56 ක් ආදායම්, ණයගැති ලැබීම් සහ අත්තිකාරම් ලැබීම් ආදී ලෙස හඳුනාගැනීමකින් තොරව සාවද්‍ය ලෙස ගෙවිය යුතු වියදම් යටතේ සෘජු තැන්පතු නමින් දක්වා තිබුණි. තවද 2016 වර්ෂයේදී රු.මිලියන 1.61 ක් වූ හඳුනා නොගත් බැංකු තැන්පතු 2018 වර්ෂයේදී රඳවාගත් ලාභයට සාවද්‍ය ලෙස ගැලපුම් කර තිබුණු අතර මේ දක්වා නිරවුල් කර නොතිබුණි. | මෙම පෙර වර්ෂයේ සෘජු තැන්පතු ලෙස හඳුනාගෙන ඇති රු.මිලියන 102.56 ක ශේෂය ණයගැති ලැබීම් ද අත්තිකාරම් ලැබීම් ද යන්න හඳුනා ගැනීමකින් අනතුරුව ශේෂ තහවුරු කිරීම් පදනම් කර ගනිමින් ඉදිරි ගිණුම් කටයුතුවලදී ගැළපීම් සිදුකිරීමට කටයුතු කරයි. රු.මිලියන 1.61 ක ශේෂයේ නිරවද්‍යතාව පිළිබඳව තහවුරුවක් ලබා ගෙන යම් ගැළපීමක් අවශ්‍ය වේ නම් ඉදිරි ගිණුම් තුළින් අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | සෘජු තැන්පත් සහ හඳුනානොගත් බැංකු තැන්පතු ලෙස දක්වන ලද ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්වලට ගැලපීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.මිලියන) | අනුරූපි වාර්තා අනුව වටිනාකම (රු.මිලියන) | වෙනස (රු.මිලියන) | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ණයගැතියෝ | 315.15 | 314.08 | 1.07 | හර වගකීම් ශේෂයක් සහිත ගිණුමක් පැවතීම අසාමාන්‍ය බැවින් 2020 වර්ෂයේ ගිණුම් තුළින් ගැලපීමට කටයුතු කරනු ඇත. | ණයගැති ශේෂයන්හි වෙනස නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විකුණුම් ආදායම | 754.11 | 825.09 | 70.98 | වැට් බදු වාර්තා සකස් කිරීමේදී විකුණුම් අගයන් excel භාවිතයෙන් සකස් කළ අලෙවි වාර්තා | වැට් බදු වාර්තා විකුණුම් හා සංසන්දනය කරමින් විකුණුම් ආදායම් |

| | | |
|---|---|---|
| | භාවිතයෙන් සකස් කර තිබුණු අතර එහි ඇතැම් අගයයන්හී දෝෂ පැවතී ඇති අතර, ගිණුම්කරණ පද්ධතිය වෙත නිවැරදිව විකුණුම් අගයන් ඇතුළත් කර ඇත.ඒ අනුව විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව විකුණුම් ආදායම නිවැරදි වේ. නමුත් මෙම දෝෂ පැවතීම වැට් නිමවුම් අගය සඳහා කිසිදු බලපෑමක් සිදු කර නොමැති අතර 2019 වර්ෂයේ අලෙවි වටිනාකමෙහි පමණක් වෙනසක් සිදුව ඇත. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් ලබා තිබුණු ශුද්ධ අලාභය රු.මිලියන 156.35 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය රු.මිලියන 1,102.36 ක් වී තිබුණි. 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ශුද්ධ ලාභ අනුපාතය සියයට 3.5 සිට සියයට 21 දක්වා වූ සෘණ අගයන් වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් ද රු.මිලියන 1,105.49 ක සෘණ අගයක් | ආයතනයේ එවක පැවති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවක පැවති අවිනිශ්චිතභාවයන් පිළිබඳ තක්සේරු කර ඇවර කිරීමක් හෝ වෙළඳ කටයුතු අවසන් කිරීම සම්බන්ධව තීරණයක් | ආයතනය අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව හෝ අවිනිශ්චිතතාවය තක්සේරු කර ඒ පිළිබඳ හෙළිදරවු කිරීම් කළ යුතු |

| | | |
|---|---|---|
| වී තිබුණි. තවද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව රු.මිලියන 940.02 ක් වූ ණය නියමිත පරිදි ආපසු නොගෙවීම හේතුවෙන් ණය සඳහා ඇප තබන ලද සමාගමේ දේපල නෛතිකව පවරා ගැනීම සඳහා විවිධ පාර්ශවයන් විසින් හිමිකම් ඉල්ලීම් කර තිබුණි. මෙම කරුණු අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.<br><br>කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්හි ඡේද අංක 3.8 හා 3.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් ආයතනය අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් සිදු කළ යුතු අතර, ඒ පිළිබඳව අවිනිශ්චිතතාවයක් පවතීනම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අතර අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සටහන් අංක 1.8 මඟින් ප්‍රමිතියේ අවශ්‍යතාවය පරිදි තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.<br><br>තවද, සමාගම විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය පරිදි සමාගමේ කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවා සමාගමට දැරීමට සිදුවී ඇති පාඩුවල ස්වභාවය හා ප්‍රමාණය සහ පාඩුවලට හේතුව, එවැනි පාඩුව සිදුවීම වැළැක්වීමට හෝ පාඩු පිරිමසා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පියවර කිසිවක් ගෙන ඇති නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ පිළිබඳව පිළියෙල කළ වාර්තාවක් කොටස් හිමියන් වෙත යැවිය යුතු වුවත් එම අවශ්‍යතාවයද සම්පූර්ණ කර නොතිබුණි. | ගෙන නොමැති අතර ආයතනයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. ආයතනයේ කොටස් සියයට 100 ක්ම මහා භාණ්ඩාගාරය සතුව පවතින අතර මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂවරයෙක් අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරනු ලබයි. | අතර සමාගමේ පාඩුවලට හේතුව, පාඩු සිදු වීම වැළැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන ඇති පියවර පිළිබඳව වාර්තාවක් කොටස් හිමියන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | දේපල, පිරියත හා උපකරණ | 122.21 | ස්ථාවර වත්කම් ලේඛනයක්, විස්තරාත්මක උප ලේඛනයක් හෝ විස්තරාත්මක භාණ්ඩ සමීක්ෂණ වාර්තා | මෙම ඌණ ගණනයට හේතුව වූයේ ආයතනය සතුව 2019 දෙසැම්බර් 31 දිනට සවිස්තරාත්මක ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබීමයි. එහෙත්, 2023 දෙසැම්බර් 31 සහ 2024 දෙසැම්බර් 31 න් අවසන්වන වර්ෂ සඳහා ස්ථාවර වත්කම් නිසි පරිදි ගණනය කර ඇත. එම ගණනය කිරීම් අනුව, | ස්ථාවර වත්කම් ලේඛනයක් කඩිනමින් පිළියෙල කර වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය |
| (ආ) | දේපල, පිරියත හා උපකරණ ක්ෂය | 93.19 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | සවිස්තරාත්මක ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර එය පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇත. | න්ද සිදුකර එම වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විකිණීම සඳහා වූ තොග | 45.84 | භෞතික තොග සත්‍යාපන වාර්තා | තොග පාලන අංශය විසින් ශාඛා සහ ගබඩා 22 ක් සඳහා වෙන වෙනම තොග ලෙජරයන් පවත්වාගෙන යනු ලබන අතර එම ලෙජරයන් පදනම් කර ගනිමින් 2019 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ වටිනාකම් වල එකතුව රු.මිලියන 45.84 ක් ලෙස ගිණුම්කරන පද්ධතිය වෙත ගැලපුම් කර ඇත. 2021 වර්ෂයේ සිට තොග සත්‍යාපන කටයුතු වාර්ෂිකව සිදුකර ගෙන යනු ලබයි. | තොග ලෙජරයන් පවත්වා ගැනීම සහ තොග සත්‍යාපන කටයුතු නියමිත පරිදි සිදු කිරීමට හා එම වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ලැබිය යුතු අත්තිකාරම් | 3.35 | අත්තිකාරම් ලේඛන හා අදාළ මූලාශ්‍ර ලියවිලි | මෙම රු.මිලියන 3.35 ක ශේෂය 2010 වර්ෂයට පෙර සිට පැවත එන ආරම්භක ශේෂයක්වන අතර සිදු වූ ගනුදෙනු තහවුරු කර ගැනීමට අදාළ මූලාශ්‍ර ලියවිලි සොයා ගැනීමට මෙතෙක් නොහැකි වී ඇත. | අත්තිකාරම් ශේෂවල හා ලබාගෙන ඇති අයගේ විස්තර පිළිබඳ නිවැරදිතාව ය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් වූ උපකාරක ලියවිලි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | රාජ්‍ය ආයතන 09 කින් ලබාගෙන තිබුණු ණය සහ අත්තිකාරම් | 151.90 | නියමයන් හා කොන්දේසි සමාලෝචනය කිරීමට අවශ්‍ය ණය ගිවිසුම්, වෙනත් ආධාරක | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සෙවණ අරමුදල සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය මඟින් ලබා ගෙන ඇති පිළිවෙලින් රු.මිලියන 7.50 ක්, රු.මිලියන 90.00 ක් සහ රු.මිලියන 51.40 ක ණය මුදල් | ණය ගිවිසුම්, වෙනත් ආධාරක ලියවිලි සහ ශේෂ සනාථන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ලියකියවිලි සහ ශේෂ සනාථන | සම්බන්ධයෙන් ශේෂ සනාතන කැදවීම් කළ අතර එවැනි ණය ශේෂයක් නොමැති බවට වන සනාථන ලිපි මේවන විට ලැබී ඇත. ඒ අනුව නිසි ක්‍රමවේදයට අනුකූලව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලබයි. තවද සමූපකාර තොග වෙළඳ ආයතනය වෙතින් ලබා ගෙන ඇති රු.මිලියන 3 ක ණය මුදල සම්බන්ධව ශේෂ සනාතන කැදවීම් කළ අතර ඒ සඳහා මෙතෙක් සනාථන ලිපි ලැබී නොමැත<br><br>ඇති රු.මිලියන 3 ක ණය මුදල සම්බන්ධව ශේෂ සනාතන කැදවීම් කළ අතර ඒ සඳහා මෙතෙක් සනාථන ලිපි ලැබී නොමැත. | ලබාගෙන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඇපයට තබා ඇති ඉඩම් | 40.86 | මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණු අදාළ ගැලපීම් හෝ අනාවරණයන් | නිවාස සංවර්ධන හා මූල්‍ය සමාගම මඟින් ලබා ගෙන ඇති 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 40.86 ක ණය ශේෂය නිරවුල් නොකිරීම මත ඇපයට තබන ලද ඉඩමේ අයිතිය ඔවුන් විසින් මේවන විටත් පවරා ගෙන ඇත. | ණය මුදල් ආපසු ගෙවා ඇපයට තැබූ දේපල නිදහස් කරගැනීමට කටයුතු නොකළ වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නිසි පියවර ගත යුතුය. |
| (උ) | ස්කන්ධය යටතේ දක්වා ඇති සීමිත සංචිතය (Restricted Reserve) | 16.11 | හර ශේෂය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විස්තර ඇතුළත් මූලික ලියවිලි, උපලේඛන, අදාළ අනුමැතීන් | මෙම රු.මිලියන 16.11 ක ශේෂය 2010 වර්ෂයට පෙර සිට පැවත එන, පෙර පැවති ආරම්භක හර සහ බැර ශේෂයන් කිහිපයක එකතුවක් වන අතර සිදු වූ ගනුදෙනු තහවුරු කර ගැනීමට අදාළ ලියවිලි සොයා ගැනීමට නොහැකි වී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙවැනි ගිණුම් තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඌ) | ගෙවිය යුතු වැටුප් | 3.18 | ගෙවිය යුතු වැටුප් ලෙස දක්වා ඇති හර ශේෂයට අදාළ ගෙවීම සිදු කළේ කුමන නිලධාරියෙකුටද යන්න සහ ගණුදෙනුවේ ස්වභාවය හඳුනාගැනීමට අවශ්‍ය ලියවිලි | පෙර වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී වැරදි ලෙස ජ'නල් සටහන් යොදා තිබීමෙන් මෙලෙස අසාමාන්‍ය ගෙවිය යුතු ශේෂයක් සකස් වී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් අනුව එවැනි අසාමාන්‍ය ලෙස සිදු වූ වැරදි සඳහා යොදන ලද ජ'නල් සටහන් 22 ක් විගණනය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2020 වර්ෂයේ ගිණුම් තුළින් ගැලපීමට උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වියදම් ශේෂයන් නිවැරදිව සටහන් කිරීමට කටයුතු කළ යුතු අතර වැරදි ශේෂයන් යථා පරිදි ගැලපුම් කළ යුතුය. |
| (එ) | ලංසු සුරක්ෂණ | 7.38 | ලංසු සුරක්ෂණ ශේෂ තහවුරු කිරීම් සහ ගනුදෙනු තහවුරු කිරීමට අදාළ මූලාශ්‍ර ලියවිලි | මෙම රු.මිලියන 7.38 ක ලංසු සුරක්ෂණ වටිනාකමට අදාළ ගනුදෙනු තහවුරු කර ගැනීමට අදාළ ලියවිලි සොයා ගැනීමට නොහැකි වී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලබන සෑම වත්කම් ශේෂයකටම මූලාශ්‍ර ලියවිලි සහ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | හඳුනා නොගත් ණයහිමි ශේෂය | 160.86 | ණයහිමි ශේෂය සත්‍යාපනය කිරීමට අවශ්‍ය සාක්ෂි | එකඟ වී ඇත. | ණයහිමියන් සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ඉදිරියේදී හඳුනා නොගත් නිර්ණාමික ණයහිමි ශේෂ ඇති වීමේ අවස්ථා වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | හඳුනා නොගත් ණයගැති | 147.66 | ණයගැති ශේෂය සත්‍යාපනය | එකඟ වී ඇත. | ඉදිරියේදී හඳුනා නොගත් |

| | | |
|---|---|---|
| ශේෂය | කිරීමට අවශ්‍ය සාක්ෂි | නිර්ණාමික ණයගැති ශේෂවලට හේතූන් අනාවරණය කර ගත යුතු අතර සත්‍යාපනය කළ හැකිවූ ණයගැති ශේෂයන් පමණක් ගිණුම්ගත කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් අම්බලන්තොට, තංගල්ල, ලුණුගම්වෙහෙර, තිස්ස, වීරකැටිය, ඇඹිලිපිටිය සහ සූරියවැව යන ශාඛා ගබඩාවන්ගෙන් සූරිය පොකුණ දෙබොක්කාව නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස හිමියන්ට රු.මිලියන 23.65 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය කිසිඳු සීමාවක් නොතකා නිකුත් කර තිබුණු අතර 2025 ජූලි 31 දින දක්වාම මෙම ණයශේෂ නිරවුල් වී නොතිබුණි. මෙම ශේෂයන් සම්බන්ධයෙන් කිසිඳු ශේෂ සනාථකර ගැනීමක් අදාළ නිලධාරින්ගෙන් හෝ ආදර්ශ ගම්මාන වැඩසටහනෙහි නිවාසලාභීන්ගෙන් හෝ ලබාගැනීමට සමාගමෙහි කළමනාකාරීත්වය විසින් ක්‍රියාකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ශේෂයන් හඳුනාගෙන හිඟ ණය ශේෂ අයකර ගැනීමට හා ශේෂ සනාථ කරගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ | මෙම රු.මිලියන 38.29 ක ශේෂය 2010 වර්ෂයට පෙර සිට පැවත | ගණුදෙනු වලට අදාළ මූලාශ්‍ර ලියවිලි වගකිවයුතු |

| | | |
|---|---|---|
| විලම්භිත අයහාර ලෙස වර්ෂ 06 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එනු ලබන “වන්දි ගෙවීම සඳහා වූ රජයේ ආධාර ලැබීම්” රු.මිලියන 38.30 ක් විගණිත දිනය වූ 2025 ඔක්තෝබර් 03 දින දක්වා නිරවුල් කර නොතිබුණි. | එන ආරම්භක ශේෂයක්වන අතර සිදු වූ ගනුදෙනු තහවුරු කර ගැනීමට අදාළ මූලාශ්‍ර ලියවිලි සොයා ගැනීමට මෙතෙක් නොහැකි වී ඇත. | නිලධාරියෙකු භාරයේ ආරක්ෂිතව පවත්වාගත යුතු අතර අදාළ ගිණුම් නිරවුල් කිරීමට නොපමාව පියවරගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 7.4.1 ඡේදය | අවම වශයෙන් මාස 03 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් බැගින් පැවැත්විය යුතු වුවද, 2019 වර්ෂය සඳහා කිසිදු විගණන හා කළමනාකරණ රැස්වීමක් පවත්වා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට ඉදිරියේදී කටයුතු කළ යුතුය. |
| | (ii) 8.3.3 (අ) ඡේදය | ප්‍රසාද දීමනා ගෙවීමට සුදුසුකම් ලැබීම සඳහා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන එම වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2018 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශන දින 1700 ක් ප්‍රමාද වී 2023 ඔක්තෝබර් 27 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබිය දී 2018 වර්ෂයට අදාළ ප්‍රසාද දීමනා රු.මිලියන 0.62 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් කර ගිණුම්ගත කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත වේලාවට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ප්‍රසාද දීමනා වලට අදාළ කටයුතු ආරම්භ කළ යුතුය. |
| | (iii) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 | සමාගමේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 | අදහස් දක්වා | චක්‍රලේඛ ප්‍රකාරව සැලසුම් |

| | | | |
|---|---|---|---|
| දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදුන් මාර්ගෝපදේශයේ ඇමුණුම I හි (1) සහ (2) ඡේද | කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් හා ඊට අනුරූපීව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර සෑම මුදල් වර්ෂයක් ආරම්භ වීමට දින 15 කට පෙර අදාළ සැලසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ කර නොතිබුණි. | නොමැත. | සකස් කිරීමේ කටයුතු සිදු කර අනුමැතිය ලබාගත යුතුය. |
| (iv) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදුන් මාර්ගෝපදේශයේ ඇමුණුම I හි (3) ඡේදය | වාර්ෂික අයවැය ලේඛනය සමඟ අයවැයගත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ලේඛනය සමඟ අයවැය ගත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (v) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඉ) සහ 9.3.1 ඡේද හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදුන් මෙහෙයුම් අත්පොතේ 3.1 හා 3.2 ඡේද | සමාගමට අවශ්‍ය කාර්ය මණ්ඩලය හා බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව සමාගමේ කාර්ය මණ්ඩලය හා බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.7 හා 3.2.7 ඡේද | එක් එක් වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඊළඟ වර්ෂයේ ජුනි 30 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඒ බව ජුනි 30 දිනට පෙර රාජ්‍ය මුදල් | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වාර්තා අදාළ |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂකට දැනුම් දිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | පාර්ශවයන් වෙත යොමු කළ යුතුය. |

**1.8** **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 59.09 ක් වූ ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු, ව්‍යාපාර පිරිවැටුම් බදු, එකතු කළ අගය මත බදු හා ආර්ථික සේවා ගාස්තු ගෙවීමට සමාලෝචිත වර්ෂය තුළ දීද කටයුතු කර නොතිබුණු අතර ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු රු.මිලියන 3.87 ක් හිලව් කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. | ගෙවිය යුතු බදු නිසි පරිදි බදු රෙගුලාසිවලට අනුව ගෙවීම් කිරීමට හා බදු සහන ලබාගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 156.35 ක පාඩුවක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූප පාඩුව රු.මිලියන 167.21 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 10.86 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2018 වර්ෂයට සාපේක්ෂව 2019 වසරේදී විකුණුම් ආදායම රු.මිලියන 523.18 ක් වැඩි වී තිබුණු අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 235 ක වැඩි වීමකි. එසේම, රු.මිලියන 215.86 ක් වූ විකුණුම් පිරිවැය 2019 වසරේදී රු.මිලියන 623.02 ක් දක්වා වැඩි වී තිබුණු අතර එය 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 189 ක වැඩි වීමකි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

2018 වර්ෂයේ 1.02:1 ක්ව පැවති ජංගම අනුපාතය 2019 වර්ෂයේදී 0.76:1 දක්වා පහළ බැස තිබූ අතර, එය කෙටි කාලීන වගකීම් පියවීම සඳහා ප්‍රමාණවත් ජංගම වත්කම් නොපවතින බවට දර්ශකයකි. තවද, දළ ලාභ අනුපාතය සියයට 3 සිට සියයට 16 දක්වා වර්ධනය වී තිබුණද, ශුද්ධ ලාභ අනුපාතය 2018 වර්ෂයේ සියයට (75) සිට 2019 වර්ෂයේ සියයට (21) ක් ලෙසත්, තෝලන අනුපාතය සියයට (101) සිට සියයට (85) ක් ලෙසත් සෘණ අගයක පැවතිණි. ඒ අනුව, දළ ලාභයේ වර්ධනයක් පෙන්නුම් කළද, මෙහෙයුම් වියදම් හා අනෙකුත් වියදම් හේතුවෙන් ආයතනය අඛණ්ඩව අලාභ තත්ත්වයක පවත්නා බවත්, ආයතනයේ ද්‍රවශීලතාවය සහ මූල්‍ය කාර්යසාධනය යහපත් තත්ත්වයක නොපවතින බවත් එම තත්ත්වය ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වයට අහිතකර ලෙස බලපාන බවත් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වෙළඳ සංස්ථා පනතේ 2 වැනි වගන්තියේ i වැනි උප වගන්තිය අනුව 1971 ජුනි 17 දිනැති අංක 14,962/43 හා 1992 වර්ෂයේදී රජය සතු සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමේදී හඳුනාගත් අරමුණු අතරින්, දේශීය අමුද්‍රව්‍යවලින් ගොඩනැගිලි ද්‍රව්‍ය නිශ්පාදනය කිරීමට පෙළඹවීම, ගොඩනැගිලි ද්‍රව්‍ය නිශ්පාදනය කරන්නන්ට ආධාර ලබා දීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය කිරීම, ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තයට අදාළ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම, එම උපකරණ අලෙවි කිරීම සහ බෙදා හැරීම යන අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී සමාගම කටයුතු කර නොතිබුණු අතර දේශීය නියෝජිතයන්ගෙන් හා විවෘත වෙළඳපලෙන් මිලදී ගත් ගොඩනැගිලි ද්‍රව්‍ය ලාභාන්තිකයක් සහිතව අලෙවි කිරීම පමණක් සිදු කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | සමාගම සංස්ථාපනය කරන ලද අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් | නිර්දේශය |
|---|---|---|

**දැක්වීම**

| | | | |
|---|---|---|---|
| (අ) | 2007 සැප්තැම්බර් 27 දිනැති අංක අමප/07/1625/342/021 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොළඹ 12 ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි සමාගමට අයත් ඉඩමකින් පර්චස් 100 කින් යුත් බිම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පැවරීම වෙනුවෙන් රු.මිලියන 50 ක අත්තිකාරම් මුදලක් 2008 පෙබරවාරි 22 දින සමාගම විසින් ලබාගෙන තිබුණි. එහෙත් 2012 මැයි 07 දිනැති අංක 12/0446/540/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කර තිබුණු අතර ලබාගත් අත්තිකාරම් මුදල ආපසු ගෙවිය යුතු විය. 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම නොවන බැරකම් යටතේ මෙම ගෙවිය යුතු අත්තිකාරම් මුදල දක්වා තිබුණු නමුත් විගණිත දිනය වූ 2025 ඔක්තෝබර් 03 දින දක්වාම එම මුදල් ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂයක් පවතින අතර පවතින මූල්‍ය දුෂ්කරතාවය මත ගෙවීම් කිරීමට නොහැකි වී ඇත. මෙම ශේෂය නිරවුල් කර ගැනීම සම්බන්ධව රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇති අතර ඉදිරියේදී දෙපාර්ශවයේ එකඟතාවය මත කටයුතු කිරීමට බලාපොරොත්තු වී ඇත. | බාහිර පාර්ශවයන්ගෙන් ලබාගත් ණය මුදල් එකඟතාවයකට පැමිණීමට හෝ ගෙවා අවසන් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | මාතර කඩේවීදිය නැගෙනහිර අංක. 417/ඒ දරන ස්ථානයේ පිහිටි සමාගම සතු ගොඩනැගිල්ලෙහි කොටසක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අනවසරයෙන් පරිහරණය කරන අතර සමාගම ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම රූඩ් 03 යි පර්චස් 35.6ක් වූ අනුරාධපුරයෙහි පිහිටි ඉඩමක නඩු කටයුතු 2013 ජූලි 07 දින අවසන් වී ඇතත් අනවසර පදිංචිකරුවන් ඉවත්කර භුක්තිය භාර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | දේපළ වල අනවසර පදිංචිකරුවන් ඉවත් කර භුක්තිය භාර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගමට අයත් මොරටුව හා අනුරාධපුර පිහිටි අක්කර 3 රූඩ් 1 පර්චස් 17 ඉඩම් වෙනුවෙන් ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අනුරාධපුර, ඇඹිලිපිටිය, මහනුවර, මන්නාරම, මඩකළපුව, අම්පාර හා නුවරඑළිය පිහිටි අක්කර 3 රූඩ් 3 පර්චස් 9.1 ක් වූ ඉඩම් 07 ක් සඳහා මිනින්දෝරු සැලසුම් ද සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉඩම් වෙනුවෙන් මිනින්දෝරු සැලසුම් සකස් කිරීමට හා ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අංක 549/A, බොරුපන, මොරටුව පිහිටි ඉඩමේ අයිතිය 2019 අගෝස්තු 21 දිනැති අංක අමප/19/2192/122/076 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් සමාගම වෙත ලබාදීමට අනුමැතිය ලබා දී ඇතත් සමාගම විසින් ඉඩමේ අයිතියට අදාළ ඔප්පුව සකස් කර ගැනීමට විගණිත දිනය වූ 2025 ඔක්තෝබර් 03 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉඩමේ අයිතිය ලබා ගැනීමට අදාළව ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාගම සතු අංක 541 ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 හි පිහිටි ඉඩමෙන් පර්චස් 100 ක ඉඩම් ප්‍රමාණයක් 1998 නොවැම්බර් 09 දින ලංකා බැංකුව වෙත රු.මිලියන 70 කට විකුණා තිබුණු අතර, පසුව සමාගම විසින් 2018 ඔක්තෝබර් මස 23 දින ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද රු.මිලියන 500 ක ණය මුදලින් ඉහත විකුණුම්කරයට අදාළ රු.මිලියන 70 ක මුදල හිලව් කරගෙන තිබුණි. ලංකා බැංකුව ඉහත සඳහන් මුදල හිලව් කිරීමෙන් අනතුරුව බැංකුව විසින් සකස් කර එවා තිබුණු ඔප්පුවේ වටිනාකමට අදාළ ඔප්පු ගාස්තුව වූ රු.මිලියන 5.38 ක මුදල ගෙවා නැවත ඉඩම පවරාගත යුතුව තිබුණ ද 2025 ඔක්තෝබර් 03 දිනවන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒවන විට ගෙවිය යුතුව පැවති ඔප්පු ගාස්තුව රු.මිලියන 18.40 ක් දක්වා වැඩි වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | නියමිත ඔප්පු ගාස්තු ගෙවා ඉඩම පවරා ගැනීමට කළමනාකරණය විසින් අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2013 වර්ෂයේදී රත්නපුර සහ ගාල්ල ඉඩම් කැබලි දෙකක් උකස් කර මාස 08 කින් ගෙවා නිම කිරීමේ පදනම මත සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන තිබුණු රු.මිලියන 75 ක ණය මුදලෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය රු.මිලියන 62.09 ක් හා හිඟ පොලිය රු.මිලියන 45.69 ක් විගණිත දිනය වූ 2025 ඔක්තෝබර් 03 දින දක්වා නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | බාහිර පාර්ශවයන්ගෙන් ලබාගත් ණය මුදල් එකඟ වූ පරිදි ගෙවා නිරවුල් කිරීමට හෝ එම පාර්ශවයන් සමඟ ලිඛිත එකඟතාවයකට පැමිණ ඒ අනුව කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම සතු කුන්ගුනියාර් උප්පුකුලම් කරෙයි යාපනය පිහිටි රුඩ් 01 යි පර්චස් 31.6 ක ඉඩම සහ නුවරඑළිය බඹරකැලේ ගොඩනැගිල්ල සහ ඇඹිලිපිටිය යෝධගම නිවාස 02 ක් 2017 වර්ෂයේ සිට භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව තිබුණි. | අදහස් දක්වා නොමැත. | වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2025 අගෝස්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර 2020, 2021, 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මේ දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |